**නිපුණතාවය :-** ව්‍යවසායකත්වය හා එහි වැදගත්කම අවබෝධ කොට ගෙන ව්‍යවසායකයකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :-** ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය විමසයි.

(01) 'මිනිස් අවශ්‍යතා සහ වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම හා සම්බන්ධ වූ සියලු ම කටයුතු '

(i) ප්‍රාග්ධනය වේ. (ii) නවෝත්පාදන වේ. (iii) ව්‍යාපාර වේ. (iv) අවස්ථා වේ.

(02) ව්‍යාපාර කටයුතුවල නිරත පුද්ගලයන් හඳුන්වන්නේ කවර නමකින් ද ?

(03) මිනිස් අවශ්‍යතා සහ වුවමනා යන්න පැහැදිලි කරන්න.

(04) පහත දක්වා ඇති මිනිස් අවශ්‍යතා ඉටුකරගත හැකි වුවමනා 03 බැගින් ලියන්න.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| ආහාර | |
| නිවාස | |
| ඇඳුම් පැළඳුම් | |
| ආරක්ෂාව | |
| අධ්‍යාපනය | |
| විනෝදාංශ | |
| සන්නිවේදනය | |
| සෞඛ්‍ය | |

(05) මිනිස් අවශ්‍යතා සහ වුවමනා අතර වෙනස්කම් 04 ක් දක්වන්න.

(06) පහත ප්‍රකාශවල සත්‍ය/අසත්‍යතාවය දක්වන්න.

I. මිනිසා විසින් ජීවත්වීම සඳහා අනිවාර්යයෙන් ම සපුරා ගත යුතු දෑ වුවමනා වේ . (-------------)
II. පළමුව පැන නගිනුයේ වුවමනා වන අතර අනතුරුව අවශ්‍යතා පැනනගිනු ලබයි .(-------------)
III. ඇතැම් වුවමනාවන් ද කාලයක් යත්ම අවශ්‍යතාවන් බවට පත්විය හැකිය. (-------------)
IV. පුද්ගලයාගෙන් පුද්ගලයාට අවශ්‍යතා පොදු වන අතර වුවමනා විවිධ වේ . (-------------)
V. පුද්ගලයන් විසින් වුවමනා ඉටුකරගැනීම තුළින් අවශ්‍යතා ඉටුවේ. (-------------)
VI. උත්පත්තියත් සමඟ වුවමනා ඇතිවන අතර ව්‍යවසායකයින්ට හෝ ව්‍යාපාරිකයන්ට ඒවා නිර්මාණය කළ නොහැක. (-------------)

**( පෙළ පොතේ පිටු අංක 25 සිට 28 දක්වා හොඳින් කියවා පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න)**